# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 2040 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 28/07/2024
පැය 1150

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.07.27 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 140 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර**

2024.07.27 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සීගිරිය පොලිස් වසමේ කිඹිස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැති මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගිනි අවි අමතර කොටස් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සීගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වූ කිඹිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සීගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර

2024.07.27 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බේරුවල පොලිස් වසමේ අබේපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 530 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බේරුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ මග්ගොන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද ප්‍රමිතියකින් තොර වල් නාශක හා කෘමි නාශක ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුර

2024.07.27 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගලහ පොලිස් වසමේ ලුන් කඳුර පාසල අසල වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද වල් නාශක පැකට් 222, වල් නාශක කිලෝග්‍රෑම් 25 ක් හා කෘමි නාශක කිලෝග්‍රෑම් 25 ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ලොරි රථයක් සමඟ අත්අඩංගුවට ගෙන ගලහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ කොටපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගලහ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. නීති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් නව දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුර

2024.07.27 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් බලවන්තලාව පොලිස් වසමේ මාඑළිය රක්ෂිතයේ වැටලීමක් සිදු කර අනවසරෙන් ඇතුලු වී බටදෙණිය ඇළෙහි නීති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් නව දෙනෙකු මැණික් ගැරීමට යොදා ගත් උපකරණද සමඟ අත්අඩංගුවට ගෙන බගවන්තලාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවරුදු 29 හා 48 අතර වයස්වල පසුවන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** බලවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර**

2024.07.27 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර නිලධාරින් විසින් චාවකච්චේරිය පොලිස් වසමේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 20 ග්‍රෑම් 485 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන චාවකච්චේරි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ විශ්වමඩු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** චාවකච්චේරි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල කඳවුර**

2024.07.27 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල හා ආරුගම්බේ කඳවුරු වල නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ මණ්ඩාගල ප්‍රදේශයේදී ගංජා හේනක වැටලීමක් සිදු කර නීති විරෝධීව වගාකරන ලද ගංජා පැල 11500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කතරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**